**වැලිමඩ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 ජුනි 04 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී වෙන්කර තිබුණු මුද්දර ගාස්තු ණයගැති වටිනාකම ඉක්මවා, සමාලෝචිත වර්ෂය තුලදී ඉකුත වර්ෂ වෙනුවෙන් ලැබුණු රු.278,777 ක මුද්දර ගාස්තු ආදායම් සමුච්චිත අරමුදල් ගිණුමට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම රු.278,777 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.783,313 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල රු.690,916 ක් ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට බැරකම් රු.92,397 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සභාවට ලැබී තිබුණු කොඩිකණු 488 ක වටිනාකම රු.482,398 ක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැටුප් හා දීමනා රු.3,269,916 ක් වුවද, එය රු.3,474,236 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ වියදම හා දෙසැම්බර් 31 දිනට බැරකම් රු.204,320 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-----------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 59,062,614 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.72,469,113 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**
-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.22,817,724 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**
-----------------------------------------------

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් අනුමත නවාතැන් පොළවලින් ඉකුත් වර්ෂයේ ආදායමෙන් සියයට 01 ක් නොඉක්මවන මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස අයකළ යුතු වුවද, නවාතැන් පොළ 05 කින් එසේ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 371 | 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 24 කදී සභාවේ නිලධාරීන් හා බාහිර පාර්ශවයන් වෙත ගෙවන ලද රු.686,958 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571 | අවස්ථා 558 කදී සභාවේ තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු රු.3,100,718 ක් වූ තැන්පත් නියාදනය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රයේ xxiv වන පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට මියගිය හා සේවය හැර ගිය සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.40,503 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.26,007,502 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,564,207 ක් විය. ඒ අනුව රු.15,443,295 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී පැවති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුනි.

#### 2.2.2 බදු කුලී

i. සභාවට අයත් අංක 58 හා අංක 59 දරන කඩ කාමරවල වෙළඳාම් කිරීමේ අයිතිය 2011 වර්ෂය සඳහා බදුගත් බදුකරුවන් විසින් ගෙවිය යුතු රු.742,092 ක හිඟ කුලී අයකර ගෙන නොතිබුණි.

ii. නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදුගෙන තිබුණු බදුකරුවන් විසින් කඩකුලී ගෙවීම පැහැර හැරීම මත 2014 දෙසැම්බර් වන විට අයවිය යුතු රු.1,055,511 ක හිඟ කුලී අයකර ගෙන නොතිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 10,567,073 |
| මුද්දර ගාස්තු | 16,007,171 |
| | ------------ |
| | 26,574,244 |
| | ======== |

3. **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

3.1 මළාපවහන ව්‍යාපෘතිය

-----------------------

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.99,205,979 ක් වැයකර උපදේශන සමාගමක් වෙත රු.16,831,019 ක් ගෙවා වැලිමඩ නගරයේ ඉදිකල මළාපවාහන ව්‍යාපෘතිය වැඩ නිමකර 2013 ජනවාරි 14 දින සභාවට භාරදී තිබුණද, සම්බන්ධතාවය ලබාදීමට සැලසුම් කර තිබුණු ඒකක 176 න් 2014 දෙසැම්බර් මාසය වන විටත් සම්බන්ධතාවය ලබාදී තිබුණේ පාරිභෝගිකයින් 10 දෙනෙකු සඳහා පමණි.

(ආ) එසේම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර සම්බන්ධතා ලබාදීමට යාමේ දී අදාල ස්ථානවල සම්බන්ධතා නල එළා නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර, ඇතැම් පාරිභෝගිකයින්ගෙන් අයකර තිබුණු මුදල් ද ආපසු ගෙවා තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.34,142,123 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර, අදාල පොළිය පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් ආදායමක් ව්‍යාපෘතියෙන් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල සීමාවට අයත්, තිස් අවුරුදු පදනම මත බදුදී තිබුණු ඉඩම් සම්බන්ධයෙන් බදු ගිවිසුමේ 1:3 වගන්තිය අනුව අවුරුදු 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර බදු මුදල තීරණය කර නොතිබුණු අතර බදු කුලී අයකිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම නොසැලකිලිමත්ව කටයුතු කර තිබුණි. 2011 ජූලි හා 2014 මැයි වන විට බදු ගිවිසුම් කාල සීමාව අවසන් වී තිබුණු දේපල 05 ක් සම්බන්ධයෙන් අදාල ගිවිසුම්වල

කොන්දේසි හා ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති අංක:එස්පී/ආර්ඩී/02/10 දරන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

(අ) 2014 උපමාන පාදක සංවර්ධන යෝජනා යටතේ, හග්ගල වත්තේ පහල කොටසේ පවුල් 50 කට පමණ පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබුණු රු.50,000 ක මුදල, අදාල ව්‍යාපෘතිය පවරන ලද සමිතිය මඟින් නිසි පරිදි ඉටුකරවා ගැනීමට කටයුතු නොකර, ආපසු හරවා යැවීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ ජනතාවට හිමිවීමට තිබූ ප්‍රතිලාභ සභාවේ නොසැලකිල්ල මත අහිමිකර තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය අතරතුර කාලයේ දී ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබුණු රු.1,700,352 ක වැටුප් හා රු.156,500 ක මන්ත්‍රීදීමනා ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

3.4 **නිශ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

-------------------------------------

පහත දැක්වෙන වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

(අ) 1993 වර්ෂයේ දී රු.138,650 කට මිලදී ගෙන තිබුණු අංක 204-8982 දරන ත්‍රිරෝද රථය

(ආ) කැප්පෙටිපොල උප කාර්යාල භූමියෙහි රඳවා තිබෙන පහත සඳහන් වත්කම්

- i. සන්ටෙක් වර්ගයේ අත් ට්‍රැක්ටරය
- ii. 270-0431 දරන ට්‍රැක්ටරය
- iii. ට්‍රේලරය
- iv. රොටෝ මාස්ටර් අත්ට්‍රැක්රය හා නගුල

(ඇ) කැප්පෙටිපොල උප කාර්යාලයේ 20' x 12' ප්‍රමාණයේ ගබඩා ගොඩනැගිල්ල

(ඈ) උඩ දෙමෝදර ඉඩම

3.5 **හඳුනාගත් අලාභ**

-------------------

(අ) සභාවට අයත් අංක 252-6331 දරන කැබ් රථය අනතුරට පත්වීමෙන් පසු සිදුකළ අළුත්වැඩියාව සඳහා දරන ලද වියදමෙන් රක්ෂණ සමාගමෙන් අයකර ගත නොහැකි වූ රු.359,988 ක මුදල අනතුර සඳහා වගකිව යුතු සභාපතිවරයාගෙන් අයකර ගෙන නොතිබුණු බැවින් සභා අරමුදලට රු.359,988 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ආ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් සභාවට ලබාදෙන ලද රු.77,500 ක් වටිනා ඩෙක්ස්ටොප් පරිගණකයක් හා මුළු වටිනාකම රු.4,250 ක් වූ උදළු තල 05 ක් අස්ථානගතව පැවතුණි.

3.6 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

වැලිමඩ නගරය පුරා තැනින් තැන කසල ගොඩගසා තිබීම හේතුවෙන් නගරය අපවිත්‍රවී තිබූ අතර, පරිසර දූෂණය මඟින් මහජන සෞඛ්‍යයට බලවත් තර්ජනයක් එල්ලවී තිබුණි.

4. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් පාලනය